## සබරගමුව පළාත් සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සබරගමුව පළාත් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(අ) පළාත් සභා අරමුදල් ගිණුම

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2012 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

(ආ) අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2012 ජුනි 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2011 වර්ෂයට අදාල | | |
|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 28 | 28 | - |
| (ii) | ආදායම් ගිණුම් | 01 | 01 | - |
| (iii) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 25 | 23 | 02 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 03 | 03 |
| (v) | අරමුදල් ගිණුම් | 03 | 01 | 02 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 03 | 03 | - |
| | | 66 | 59 | 07 |

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම / ගනුදෙනු මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | | ආදායම් | | වියදම් | | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අවස්ථා ගණන | අගය රු. | අවස්ථා ගණන | අගය රු. | අවස්ථා ගණන | අගය රු. | අවස්ථා ගණන | අගය රු. |
| (අ) | ගිණුම්වල වැඩියෙන් දැක්වීම | 01 | 87,458,612 | 01 | 804,182 | 05 | 6,037,913 | 05 | 7,522,533 |
| (ආ) | ගිණුම්වල අඩුවෙන් දැක්වීම | - | - | - | - | 01 | 9,358,071 | - | - |
| (ඇ) | ගිණුම්වලින් අත්හැරීම් | - | - | - | - | 02 | 2,667,427 | - | - |
| | එකතුව | 01 | 87,458,612 | 01 | 804,182 | 08 | 18,063,411 | 05 | 7,522,533 |

1.3.2 වර්ගීකරණ දෝෂ

2011 දෙසැම්බර් 31 දිනට ගිණුම අනුව දක්වා තිබූ එකතුව රු.1,116,359,799 ක් වූ ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු වලින් නියෝජනය වන කෙටිකාලීන ආයෝජන පාද සටහන් අංක 14(C) හි භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජන ලෙස දක්වා තිබුණි. 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාලව විගණන විමසුමකින් ද මෙම ඉදිරිපත් කිරීමේ දෝෂය අනාවරණය කර තිබුණ ද, මෙම ආයෝජන දිගින් දිගටම භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජන ලෙස දක්වමින් පළාත් සභාව සතු අතිරික්ත මුදල් මධ්‍යම රජයේ භාණ්ඩාගාරයට ප්‍රේෂණය වී ඇති බවට සාවද්‍ය දර්ශනයක් නිරූපනය වේ.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.27,764,611 ක් වූ අතර, උපයෝගි ලේඛන/වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.27,641,434 ක් විය.

1.3.4 බැංකු සැසඳුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන 08 ක බැංකු ගිණුම් 15 කට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදයක් දක්නට ලැබුණි.

(ආ) මාස 06 ක කාලයක් ඉක්මවා නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල එකතුව රු.267,784,382 ක් වූ චෙක්පත් 566 ක් සම්බන්ධයෙන් මු.රෙ.396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) මාස 06 ක කාලයක් ඉක්මවා උපලබ්ධි නොවූ එකතව රු.5,120,831 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කර නොතිබුණි.

(ඈ) එකතුව රු.534,967 ක් වූ අගරු චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ඉ) බැංකු ගිණුම් 28 කට අදාල හඳුනා නොගත් හර කිරීම්වල එකතුව රු.3,138,094 ක් වූ අතර, බැංකු ගිණුම් 25 කට අදාලව හඳුනා නොගත් බැර කිරීම්වල එකතුව රු.8,512,927 ක් විය.

(ඊ) ආයතන 03 ක 2011 වර්ෂය සඳහා ලියන ලද එකතුව රු.1,734,910 ක් වටිනාකමැති චෙක්පත් 24 ක් 2012 ජනවාරි වන විටත් ආදායකයන් වෙත භාර දීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ වල වටිනාකම රු.405,922 ක් විය.

1.3.6 අග්‍රිම ගිණුම්

2011 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ එකතුව රු.63,390,918 ක් වූ අග්‍රිම හර ශේෂ හා එකතුව රු.3,372,712 ක් වූ බැර ශේෂ තිබුණි.

1.3.7 පොදු තැන්පත් ගිණුම්

මුදල් රෙගුලාසි 571 විධිවිධාන පකාරව, කටයුතු කළ හැකිව තිබුණ ද, එසේ කටයුතු නොකළ 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 ක කාලයක් ඉක්මවා තිබූ පොදු තැන්පත්වල වටිනාකම රු.41,948,428 ක් විය.

1.3.8 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

2011 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 53 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.105,481,958 ක් විය.

(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ආයතන 05 කට අදාල එකතුව රු.936,146 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි වූ අතර, කල්තොට පශු වෛද්‍ය කාර්යාලයේ ඇති අංක 100 ශ්‍රී 6674 දරන යතුරුපැදිය 2012 පෙබරවාරි 02 වන දින සිදුකල විගණන පරීක්ෂාවට ඉදිරිපත් කිරීමට අපොහොසත් විය.

1.3.9 අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 අංක 74 දරන පනතින් සංශෝධිත පරිදි 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම් පනත සහ 2007 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 66(4) වගන්තිය | ආයතන 02 ක නිලධාරීන් 09 දෙනෙකු සහ ලියාපදිංචි සමූපකාර සමිති 1156 ක සභාපතිවරුන් හා සියලු කාරක සභිකයින් විසින් වාර්ෂිකව ලබා දිය යුතු වන, නියමිත ආකෘතියේ වූ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශ නියමිත දිනට පෙර අදාල බලධාරියා වෙත භාර දීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2010 ජූලි 09 දිනැති හා අංක CA/1/1/16/1 දරන ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය | සබරගමුව පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන් 05 දෙනෙකු, පළාත් සභා ගරු මන්ත්‍රී වරුන් 30 දෙනෙකු හා නිලධාරීන් 04 දෙනෙකු වෙනවෙන් 2010 වර්ෂයේ දී චීනයේ හා තායිලන්තයේ සංචාරය සඳහා රු.7,141,300 ක් ද, 2011 වර්ෂයේ දී ගරු මන්ත්‍රීවරුන් තිදෙනෙකු හා ප්‍රධාන ලේකම්වරයා වෙනුවෙන් කැනඩාවේ අධ්‍යාපන චාරිකාවක් සඳහා රු.1,432,000 ක් ද වැයකර තිබුණු අතර, අදාල නිලධාරීන් විසින් විදේශ ගමන් සම්බන්ධව සවිස්තරාත්මක වාර්තාවක් විදේශ ගමන් අනුමත කළ බලධාරියා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | ජනාධිපති ලේකම්ගේ අංක සිජ් /1 /17/1 හා 2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය | ඉඩම් හා කෘෂිකර්ම පිළිබඳ ගරු අමාත්‍යවරයාගේ පාවිච්චිය සඳහා නිදහස් කල හැක්කේ වාහන තුනක් වුවද ඊට පටහැනිව 2011 ජනවාරි 07 දින සිට වාහන 04 ක් නිදහස් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2000 ජුනි 27 දිනැති PF/PE/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අතිරික්ත මුදල් ආයෝජනය සඳහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු නමුත්, අදාල අනුමැතිය රහිතව සමුපකාර අරමුදලින් රු.9,575,000 ක් ද, තීරක අරමුදලින් රු.7,000,000 ක් ද සහ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලින් රු.4,130,000 ක් ද වශයෙන් එකතුව රු.20,705,000 ක් වූ අරමුදල් ස්ථාවර තැන්පතුවල දීර්ඝ කාලයක සිට ආයෝජනය කර තිබුණි. |
| (ඉ) | අංක 41/90 හා 1990 ඔක්තෝබර් 10 දනැති රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | දැවෙන ඉන්ධන ප්‍රමාණය පිළිබඳව මාස 06 කට වරක් පරීක්ෂා කර බැලිය යුතු වුවත්, ආයතන 04 ක වාහන 09 කට අදාලව එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබූ බව වාහන ලොග් පොත පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. |
| (ඊ) | 2000 ජුනි 20 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 2000/34 | අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ අනුමැතියක් ලබා නොගෙන කාර්ය නියුක්ත පදනමින් හෝ වැඩ බලන පදනමින් ශ්‍රේණිධාරීන් නොවන ගුරුවරුන් විදුහල්පති තනතුරට පත් නොකල යුතු අතර, එසේ පත් කරනු ලබන තැනැත්තන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීමේ වගකීම අමාත්‍යාංශය භාර ගනු නොලබන බවත් දක්වා තිබිය දී ඊට පැටහැනිව ශ්‍රී ලංකා ගුරු සේවයේ නිළධාරීන් 54 දෙනෙකු වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස පත් කර තිබුණි. |
| (උ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2008/35 සහ 2008 සැප්තැම්බර් 01 දිනැති "පාසල් නගා සිටුවීමේ වැඩසටහන" මැයෙන් ව චක්‍රලේඛයේ ජේද අංක 11.5 | මිල ගණන් කැඳවීමෙන් තොරව පාසල් සංවර්ධන කමිටුවේ සභාපතිගේ අභිමතය පරිදි, මසකට සැපයුම් වැඩ හෝ සේවා සඳහා වියදම් කළ හැකි උපරිම මුදල රු.20,000 ක් වුවත්, එයට පටහැනි ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාලයක 2011 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා වන මාස 09 ක කාලච්ඡේදය තුළ දී එකතුව රු.1,121,646 කින් මෙම සීමා ඉක්මවා ගෙවීම් සිදුකර තිබුණි. |
| (ඌ) | අංක CA/A2/01/2002 හා 2004 ජුලි 30 දිනැති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | චක්‍රලේඛය නිකුත් කරන දිනට පෙර සහ පසු කාලයට අදාලව රෝහල් වල පවත්වා ගෙන යනු ලබන ආපනශාලා ආදායම රජයේ ආදායමට බැර කරන ලෙස දන්වා තිබුණද, මාවනැල්ල රෝහල විසින් එසේ කටයුතු නොකිරීම නිසා 2000 වර්ෂයේ සිට 2011 දක්වා රු.2,149,200 ක් හා කිරි හලින් 2009 ජුලි සිට 2011 දක්වා රු.34,000 ක ආදායමක් අහිමි වී තිබුණි. |
| (එ) | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක HM/E/05/06/01 හා 2010 නොවැම්බර් 04 දිනැති ලිපිය | කෑගල්ල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශයට අයත් සෞඛ්‍ය නිල නිවාසවල පදිංචිකරුවන්ගෙන් 2011 වර්ෂය තුළ නිල නිවාස කුලිය රු.234,048 ක් අඩුවෙන් අයවී තිබුණි. |

(ඒ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාවේ මුදල් රීති සංග්‍රහය

| | | |
|---|---|---|
| i. | මු. රී. 84 , 85 සහ 177 | රත්නපුර අධ්‍යාපන කලාපයේ පාසල් 03 ක පවත්වා ගෙන යනු ලබන ගිණුම් 03 කට අදාලව එකතුව රු.6,595,138 ක් වූ වැය පත්, නිර්දේශ කිරීමකින් සහ අනුමත කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබූ අතර, මින් එක් පාසලක එකතුව රු.64,943 ක් වූ ගෙවීම් සිදුකර තිබුනේ වැයපත් සහතික කිරීමකින් ද තොරවය. |
| ii. | මු.රී. 261.2.2 | තත් කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිම වූ වහාම පියවිය යුතු අතර, කලින් ලබා ගත් අතුරු අග්‍රිමයක් පියවා නොමැති නිලධාරියෙකුට එය පියවන තෙක් නැවත අතුරු අග්‍රිමයක් නිකුත් නොකල යුතු වුවත්, ආයතන 07 ක් විසින් ඊට පටහැනි ලෙස අවස්ථා 112 ක දී එකතුව රු.4,209,333 ක් වටිනා අත්තිකාරම් පියවීම මාස 01 සිට අවුරුදු 02 දක්වා වූ කාල පරාසයක් තුල ප්‍රමාදවී තිබීම ද අවස්ථා 02 ක දී පෙර ලබාගත් අත්තිකාරම් මුදල් පියවා නොතිබිය දී රු.28,600 ක් හා රු.54,100 ක් ගෙවා තිබීම ද අවස්ථා 21 ක දී 11% සිට 100% දක්වා වූ අධි ඇස්තමේන්තු මත එකතුව රු.304,507 ක් අත්තිකාරම් ගෙවා ඉන් රු.225,306 ක් දින 03 සිට දින 83 දක්වා අත රඳවා ගෙන සිට ප්‍රමාද වී පියවා තිබුණි. |
| iii. | මුල්‍ය රීති 546.1 හා මු.රී.553.1 | ඇප ආඥා පනතට අනුව පළාත් සභාවේ ආයතන 05 ක ඇප තැන්පත් කල යුතු වූ නිලධාරීන් 35 දෙනෙකු නියමිත පරිදි ඇප තැන්පත් කර නොතිබුණි. |
| iv. | මුල්‍ය රීති 560 හා 561 | පළාත් සභාව සතු හෝ ස්ථිරව පළාත් සභාව භාරයේ ඇති සියළු වත්කම් ලේඛන ගත විය යුතු අතර, ආයෝජන සඳහා II වන පරිශිෂ්ඨයේ (ඊ) ප්‍රකාරව ලේඛනයක් පවත්වා ගත යුතු වුවත්, 2011 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,147,081,963 ක් වූ ආයතන 02 ක පැවැති කෙටි කාලීන ආයෝජන සඳහා ආයෝජන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, ආයතන 03 ක් විසින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |

(ඔ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| i. | මු.රෙ.104 | රත්නපුර දිස්ත්‍රික්කයේ මහා විද්‍යාලයක පුස්තකාල පොත් සම්බන්ධයෙන් 2005 සැප්තැම්බර් මස කරන ලද සමීක්ෂණය අනුව රු.15,338 ක් වටිනා පොත් 177 ක් ද වටිනාකම සඳහන් නොවූ පොත් 277 ක් ද අස්ථාන ගත වී තිබූ අතර, ඒ සඳහා වගකිවයුත්තන් නිශ්චය කර අලාභ හානි අයකර ගැනීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| ii. | මු.රෙ. 138(6) | වවුචරයේ මුහුණුත සඳහන් ගෙවීම් තහවුරු කරන සහතික යනාදිය වවුචරයට අමුණනු ලබන බවට වවුචරය සහතික කරන නිලධාරියා විසින් සැහීමකට පත්විය යුතු නමුත්, අවස්ථා 03 ක දී එකතුව රු.1,331,500 ක් වූ ගෙවීම්, බිල්පත් හෝ වෙනත් තහවුරු සාක්ෂි රහිතව රත්නපුර කලාපයේ මහා විද්‍යාලයක පාසැල් සංවර්ධන සමිති අරමුදලෙන් ගෙවීම් කර තිබූ බව 2011 වර්ෂයේ ගෙවීම් පරීක්ෂාවෙන් අනාවරණය විය. |
| iii. | මු.රෙ. අංක 225(1) | සියළුම ගෙවීම් සඳහා නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පුරවා පිළියෙල කරන ලද වවුචර් ඉදිරිපත් කළ යුතු වුවද, ඊට පටහැනිව අවස්ථා 14 ක දී එකතුව රු.1,491,000 ක් වූ රත්නපුර අධ්‍යාපන කලාපයේ මහා විද්‍යාලයක පාසැල් සංවර්ධන සමිත අරමුදලෙන් කරන ලද ගෙවීම් වෙනුවෙන් වවුචර් පිළියෙල කර නොතිබූ බව 2011 වර්ෂයේ ගෙවීම් පරීක්ෂාවේ දී අනාවරණය විය. |
| (iv) | මු.රෙ.1645 (අ) හා (ආ), මු.රෙ.1646 සහ මු.රෙ.1647 (ඉ) | ආයතන 07 ක වාහන 33 ක් සඳහා ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වාහන 77 කට අදාල වාහන ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| (ඕ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය v වන පරිච්ඡේදයේ 7.1 වගන්තිය සහ XXXII පරිච්ඡේදයේ 2.3.2 වගන්තිය | නිවිතිගල අධ්‍යාපන කලාපයේ මධ්‍ය මහා විද්‍යාලයක විදුහල්පතිගේ සේවය අවසන් කර තිබූ කාලය වෙනුවෙන් වැටුප් වශයෙන් රු.101,404 ක් ගෙවා තිබුණු අතර, දින 36 ක වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයක් සඳහා වැටුප් වශයෙන් රු.29,101 ක් ගෙවා තිබුණි. ඒ අනුව අදාල නිලධාරියාගෙන් අයකරගත යුතු එකතුව රු.130,505 ක් වූ මුදල් අයකරගෙන නොතිබුණි. |
| (ක) | ගුණාත්මක යෙදවුම් මිලට ගැනීම හා බෙදා හැරීම සම්බන්ධ මාර්ගෝපදේශ සංග්‍රහය 22 ඡේදය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 1982/2 දරන පාසල් සංවර්ධන සමිති චක්‍රලේඛය | (a) අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් මිලට ගැනීම හා බෙදාහැරීමට අදාල 2002 දෙසැම්බර් 04 දිනැති අංක HRD/PPM/2002/30 දරණ චක්‍රලේඛයේ, 6.5, 6.6, 7.1 යන වගන්තීන් ප්‍රකාර කටයුතු කර නොතිබුණු අතර, 12.1 වගන්තිය ප්‍රකාර නිසි අනුමැතිය සහිතව නිකුත් කිරීම සම්බන්ධයෙන් වෙනම වට්ටෝරු භාණ්ඩ ලේඛන සහ තොග පොත් පවත්වාගෙන යාම සිදුකළ යුතු වුවත්, රු.365,478 ක් වූ මිල දී ගැනීම් සම්බන්ධයෙන් තොග පොත්වල හෝ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. |

(b) රත්නපුර අධ්‍යාපන කලාපයේ මධ්‍ය මහා විද්‍යාලයක 2011 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 16 ක දී එකතුව රු.294,494 ක් වූ අධ්‍යාපන ගුණාත්මක යෙදවුම් මිල ට ගැනීමේ ද මෙම කලාපයේ මහා විද්‍යාලයක 2011 වර්ෂයේ දී පාසල් සංවර්ධන සමිති අරමුදල මඟින් රු.237,263 ක මිල දී ගැනීම් සිදු කිරීමේ දී පාසල් මිල දී ගැනීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව අක්‍රියව පවත්වා ගනිමින් ද විදුහල්පතිතුමාගේ පෞද්ගලික අභිමතය පරිදි සැපයුම් කරුවන් තෝරා ගැනීම හා ගෙවීම් කිරීම සිදුකර තිබුණි.

(ග) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු අංක 4/90 දරන 1990 ජූලි 28 දිනැති චක්‍රලේඛය

කෑගල්ල නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයේ බාල වයස්කරුවන් 12 දෙනෙකු වෙනුවෙන් තැන්පත් කරන ලද රු.255,840 ක මුදලක් විගණිත දිනය වූ 2012 ජනවාරි වන විට ගිණුම් හිමියන්ගේ වයස අවුරුදු 21 සිට 46 දක්වා ගත වී තිබුණ ද එම මුදල් අයිතිකරුවන්හට ලබා දීමට කටයුතු කර නොතිබුණි.

## 2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.1,056,423,606 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.448,266,250 ක් විය.

### 2.1 ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම් | ආදායම 2011 අයවැය ගත | 2011 තථ්‍ය | 2011 විචලනය | 2010 අයවැය ගත | 2010 තථ්‍ය | 2010 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු ආදායම | 1,509,252,000 | 1,943,637,444 | 434,385,444 | 1,560,660,000 | 1,381,762,380 | 178,897,620 |
| බදු නොවන ආදායම් | 314,748,000 | 416,079,145 | 101,331,145 | 279,340,000 | 359,662,986 | 80,322,986 |
| රජයේ ප්‍රදාන | 13,217,723,417 | 11,694,547,000 | 1,523,176,416 | 12,446,225,900 | 10,559,240,000 | 1,886,985,900 |
| විශේෂ ව්‍යාපෘති | ඇස්තමේන්තු නොකරයි. | 350,198,376 | -- | ඇස්තමේන්තු නොකරයි. | 498,120,909 | -- |
| වෙනත්(විදේශ ආධාර) | ඇස්තමේන්තු නොකරයි. | 51,705,401 | -- | ඇස්තමේන්තු නොකරයි. | 327,411,806 | -- |
| | 15,041,723,417 | 14,456,167,366 | 2,058,893,005 | 14,286,225,900 | 13,126,198,081 | 2,146,206,506 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | වියදම | | | |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 9,883,677,714 | 9,737,880,378 | 145,797,336 | 9,560,771,893 | 8,691,855,501 | 868,916,392 |
| අනෙකුත් | 2,316,060,301 | 1,949,305,290 | 366,755,011 | 2,007,824,107 | 1,655,498,969 | 352,325,138 |
| උප එකතුව | 12,199,738,015 | 11,687,185,668 | 512,552,347 | 11,568,596,000 | 10,347,354,470 | 1,221,241,530 |
| ප්‍රාග්ධන වියදම් | 2,841,985,402 | 1,712,558,092 | 1,129,427,310 | 2,717,629,900 | 2,330,577,362 | 387,052,538 |
| මුළු එකතුව | 15,041,723,417 | 13,399,743,760 | 1,641,979,657 | 14,286,225,900 | 12,677,931,832 | 1,608,294,068 |

සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදම රු.13,399,743,760 ක් විය. ඉන් 87.2% ක් පුනරාවර්තන වියදම් වූ අතර, 12.8% ක් මූලධන වියදම් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

(අ) ගිණුම් ඉදිරිපත් කර ඇති පසුගිය වර්ෂ 03 ක එම එක් එක් වර්ෂය අවසානයට හිඟ ආදායම පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | 2011 | 2010 | 2009 |
| | රු. | රු. | රු. |
| බදු ආදායම | 69,113,705 | 48,142,200 | 134,824,668 |
| බදු නොවන ආදායම | 1,524,855 | 8,134,043 | 8,408,951 |
| | 70,638,560 | 56,276,243 | 143,233,619 |

(ආ) 2010 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා පළාත් පාලන බල මණ්ඩල 21 කට අදාලව ලැබී තිබූ එකතුව රු.35,632,894 ක් වූ උසාවි දඩ මුදල් පළාත් පාලන බල මණ්ඩලවලට යවා නොතිබුණි.

(ඇ) කැගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් දීර්ඝකාලීන බදු පදනම යටතේ බදු දී තිබූ ඉඩම් වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට රු.5,313,480 ක බදු මුදල් අයකර නොතිබුණු අතර, අරණායක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කුඩා ජල විදුලි ව්‍යාපෘති තුනකින් 2011 දෙසැම්බර් 31 දිනට රු.2,537,625 ක වාර්ෂික බදු මුදලක් හිඟව පැවති අතර, තවත් ව්‍යාපෘති 04 කින් කිසිදු බදු මුදලක් අයවී නොතිබුණි.

(ඈ) දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල දැනට ක්‍රියාත්මකව පවතින පොල්ගස්වත්ත ජල යෝජනා ක්‍රමය සඳහා යොදා ගෙන ඇති හෙක්ටයාර 0.9048 ක වපසරියකින් යුක්ත අංක 330/331 දරන ඉඩම් කැබලි වෙනුවෙන් 2010 පෙබරවාරි සිට 2012 පෙබරවාරි දක්වා දීර්ඝකාලීන බදුකරයක් ලබා නොදීම හේතුවෙන්, එම ඉඩමට අදාලව පළාත් සභාවට අය කර ගත හැකිව තිබූ වාර්ෂික බදු මුදල් අහිමිව ගොස් තිබුණි.

2.3 අනුමත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 69 නියමයට හා සබරගමුව පළාත් සභා මුදල් රීති 33 හි දැක්වෙන නියමයන්ට පටහැනිව නිසි අධිකාර බලයක් නොමැතිව අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 08 ක වැඩසටහන්, ව්‍යාපෘති හා වැය විෂයයන් (1001-1003- පෞද්ගලික පඩිනඩි හැර) වල පළාත් සභාව විසින් නියම කරන ලද ප්‍රතිපාදනයන් ඉක්මවා එකතුව රු.46,843,629 ක් වූ වියදම් දරා තිබුණි.

2.4 අත්තිකාරම් ගිණුම්වල සීමාවන් පිළිනොපැදීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 503 හා පළාත් සභා මුදල් රීති 367 හි නියමයන්ට පටහැනිව අත්තිකාරම් ගිණුම් විෂයයන් 02 ක වියදමෙහි උපරිම සීමාව රු.313,870 කින් ද, විෂයයන් 01 ක හර ශේෂයේ උපරිම සීමාව රු.581,705 කින් ද ඉක්මවා තිබූ අතර, විෂයයන් 02 ක ලැබීම්වල අවම සීමාව රු.3,202,504 කින් පහත වැටී තිබුණි.

2.5 කාරක පාඩු

වාණිජ අත්තිකාරම් ගිණුමක පසුගිය වර්ෂ 03 ක දී දිගින් දිගටම කාරක පාඩු වාර්තා වී තිබුණි. මුදල් රෙගුලාසි 513 විධි විධාන අනුව යථෝක්ත කාරක පාඩු ආවරණය කර ගැනම සඳහා කටයුතු කර නොතිබූ අතර, අත්තිකාරම් ගිණුම් පාඩු පිට පවත්වාගෙන යාමේ ආර්ථික හා සමාජ සාධාරණත්වය පිළිබඳව කළමණාකාරිත්වය විසින් අවධානය යොමුකර නොතිබුණි.

2.6 මානව සම්පත් කළමනාකරණය

2.6.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2011 දෙසැම්බර් 31 දිනට සබරගමුව පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) <u>පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන</u>

| | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 1227 | 1075 |
| සහායක | 5259 | 4488 |
| සුළු සේවක | 3278 | 2442 |
| වෙනත් (අනියම් , තාවකාලික) | 34 | 365 |

(ආ) <u>පාසල් කාර්ය මණ්ඩල</u>

| | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විදුහල්පති | 1127 | 730 |
| ගුරුභවතුන් | 19216 | 18545 |
| සුළු සේවක | 859 | 208 |
| වෙනත් (අනියම් , තාවකාලික) | 230 | 100 |

මේ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 2007 දෙසැම්බර් 13 දිනැති ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට අනුව වඩාත් පහසු පාසලක සේවය කළහැකි උපරිම කාලය අවුරුදු 06 කට ද පහසු පාසලක සේවය කළහැකි උපරිම කාලය වසර 08 ට ද සීමා කර තිබුණ ද, මාවනැල්ල සහ බලංගොඩ කලාපයේ පාසැල් 129 ක ගුරුභවතුන් 923 දෙනෙකු වර්ෂ 14 සිට 30 දක්වා කාලයක් සේවය කරමින් සිටි බව නිරීක්ෂණය විය.

ii. කළමනාකරණ සේවා සහ කාර්යාල කාර්ය මණ්ඩල නිලධාරීන් 15 දෙනෙකු වසර 10 සිට 18 කට අධික කාලයක් ස්ථාන මාරු කිරීමට කටයුතු නොකර දෙහිඕවිට කලාප අධ්‍යාපන කාර්යාලයේම සේවයේ යොදවා ගෙන තිබුණි.

iii. නිවිතිගල අධ්‍යාපන කලාපයේ දෙමළ විද්‍යාලයක අනුමත සහ තත්‍ය කාර්ය මණ්ඩලය සංසන්දනයේ දී ගුරු භවතුන් 24 දෙනෙකුගේ ඌනතාවයක් ද ගුරු භවතුන් 05 දෙනෙකුගේ අතිරික්තයක් ද පවතින අතර, විදුහල්පති විසින් 2010 අගෝස්තු 06 සහ 2010 සැප්තැම්බර් 24 දිනැති ලිපි මඟින් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් මේ පිළිබඳව දැනුවත් කර තිබුණ ද, අවශ්‍ය තුලනය කිරීම් 2011 නොවැම්බර් මාසය දක්වාම සිදුකර නොතිබුණි. විද්‍යාලයේ මුළු ගුරු අවශ්‍යතාවයෙන් එනම් 62 න් ගුරු භවතුන් 24 දෙනෙකුගේම ඌනතාවයක් පැවතීම එනම්, 39% ක ගුරු ඌනතාවය විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපන ගුණාත්මකභාවය කෙරෙහි අහිතකර ලෙස බල පෑ හැකි බව ද නිරීක්ෂණය කෙරේ.

iv. සබරගමුව පළාත් ගුරු සේවයේ සහ විදුහල්පති සේවයේ ස්ථාන මාරු වීම් ක්‍රියා පටිපාටියේ 3.7 වගන්තිය ප්‍රකාරව, මොනම හේතුවක් නිසා හෝ කිසිදු පාසලක අතිරික්ත ගුරුභවතුන් විදුහල්පතිවරුන් නිදහස් කර නොයවා රඳවාගෙන සිටියහොත් එම ගුරු භවතුන්ට/විදුහල්පතිවරුන්ට ගෙවන ලද වැටුප් අදාල බලධාරීන්ට අධිභාර කළ යුතු වුවත්, ඊට පටහැනිව බලංගොඩ කලාපයේ පාසැල් 04 ක ගුරු භවතන් 07 දෙනෙකු වෙත කිසිදු කාර්යයක් නොපවරා නිශ්කාර්යව සිට තිබූ අතර, එම ගුරුභවතුන්ට 2010 වර්ෂය සඳහා එකතුව රු.1,985,460 ක වැටුප් මුදල් ගෙවා තිබුණි.

2.7 වත්කම් කළමනාකරණය
-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2.7.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්
-----------------------------------------------------

පහත විග්‍රහ කර ඇති පරිදි භෞතික සම්පත් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවල දි නිරීක්ෂණය විය.

| | වත්කම් ස්වභාවය | සංඛ්‍යාව/ වර්ග ප්‍රමාණය | වටිනාකම (රු.) | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි | 05 | ගණනය කළ නොහැක | - |
| (ආ) | වාහන | 01 | -එම- | අවුරුදු 03 |
| (ඇ) | යන්ත්‍රෝපකරණ | 07 | -එම- | මාස 08 සිට අවුරුදු 06 |
| (ඈ) | කාර්යාල උපකරණ | 06 | 45,954 | මාස 09 |
| (ඉ) | වෙනත් | 43 | 12,462,321 | මාස 03 සිට අවුරුදු 03 දක්වා |

වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ විශේෂ කරුණ පහතින් දැක්වේ.

බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ අනාරක්ෂිතව තබා තිබුණු අනුපිටපත් යන්ත්‍රයේ වයර් විනාශ වීම හේතුවෙන් අළුත්වැඩියාව සඳහා 2009 වර්ෂයේ දී රු.171,360 ක ඇස්තමේන්තුවක් ලබා දී තිබුණු නමුත්, අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම මත අළුත්වැඩියා කටයුතු 2012 මැයි 23 දින දක්වාම සිදුකර නොතිබුණු අතර, 2009 සිට 2012 මැයි 23 දක්වා නිශ්කාර්යව පැවැතුණි.

2.7.2 සමීක්ෂණය නොකළ වත්කම්

(අ) මුදල් රෙගුලාසි 756 අනුව පළාත් සභා අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු 19 ක සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණු අතර, කෑගල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පාලනය වන ආයතන 23 ක භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2005 වසරින් පසුව සිදුකර නොමැති අතර, 2010 වර්ෂය සඳහා ආයතන 18 ක් ද 2011 වර්ෂය සඳහා ආයතන 38 ක් ද භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. තවද ආයතන 05 ක භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ 2009 සහ 2010 වර්ෂය සඳහා සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාව 2012 මැයි 23 දින දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, කලාපයේ පාසල් 136 ක් අතරින් පාසල් 45 ක එකදු වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් හෝ සිදු කිරීමට 2012 මැයි 23 වන විටත් කටයුතු කර නොතිබුණි.

2.7.3 අචල ජංගම වත්කම්

2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම්වල අගය රු.2,512,067 ක් විය.

2.7.4 නිරවුල් නොකළ අත්තිකාරම්

2011 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ අත්තිකාරම් වටිනාකම රු.90,776,931 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්හි එකතුව රු.35,290,396 ක් විය.

2.7.5 අයවීමට ඇති සේවක ණය

2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.151,229,645 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිටි ගිණුම් ශේෂවල එකතුව රු.55,448,709 ක් විය.

2.8 වාහන උපයෝජනය

කැගල්ල නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයේ පවතින සුළු අළුත්වැඩියාවන් සිදු කිරීමට ඇති බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත 2011 ඔක්තෝබර් 13 දින වාර්තා කරන ලද ධාවන තත්ත්වයේ පැවැති අංක 31 ශ්‍රී 2644 දරණ වාහනය ධාවනයෙන් ඉවත් කර 2011 ඔක්තෝබර් 14 දින අබලි වාහනයක් ලෙස ලැයිස්තු ගත කර තිබුණු අතර, 2011 ඔක්තෝබර් මස සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු LW - 0129 සහ WPC2010/2011 දරන නවතම ගිලන් රථ දෙක 2012 ජනවාරි වන විටත් ධාවනය සඳහා යොදා නොගෙන කාර්යාල භූමියේ නවතා තිබුණි.

2.9 හඳුනා ගත් පාඩු හා හානි

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නියැදි විගණන පරීක්ෂණවලදී සහ ආයතනයන්හි පවත්වා තිබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුල දී එකතුව රු.5,268,641 ක වූ පාඩු හා හානි අනාවරණය වී තිබුණි.

(ආ) 2010 ගම නැගුම II අදියර යටතේ රත්නපුර අධ්‍යාපන කලාපයේ මධ්‍ය මහා විද්‍යාලයක ක්‍රීඩා පිටිය ඉදිකිරීමේ කටයුතු විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතිය මගින් සිදු කිරීමේ දී ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය නොසලකා හරිමින් විදුහල්පති තම අභිමතය පරිදි ඉදිකිරීම් ද්‍රව්‍ය හා සේවා මිල දී ගැනීම් සිදුකිරීම නිසා කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබුණු රු.350,950 ක මුදල ඉක්මවා රු.510,236 ක් වියදම් කිරීම හේතුවෙන් පාසල් සංවර්ධන සමිතියටත් පාසල නගා සිටුවීමේ ගිණුමටත් රු.159,286 ක කොන්ත්‍රාත් අලාභයක් සිදු වී තිබුණි.

(ඇ) සබරගමුව පළාත් සභාවේ මාර්ග අමාත්‍යාංශය විසින් 2007 වර්ෂයේ අවස්ථා 07 කදී කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් වශයෙන් ලබා දී තිබූ රු.4,812,643 ක මුදලක් නියමිත කාලය තුලදී, ඉදිරිපත් කර තිබූ බැංකු ඇපකරවල කාලය ඉකුත්වීමට පෙර අය කර ගැනීමට කටයුතු නොකිරීම නිසා ඉහත ප්‍රමාණයෙන් පළාත් සභා අරමුදලට පාඩු සිදු වී තිබුණි.

(ඈ) මාවනැල්ල මූලික රෝහලේ 2011 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව රෝහලේ ශල්‍ය ගබඩාව, ඖෂධ ගබඩාව, රසායනාගාරය හා පොදු ගබඩාව යන අංශයන්හි භාණ්ඩ හා ඖෂධ ආදියෙහි සිදුව ඇති ඌනතාවය රු.296,712 ක් වූ අතර මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.10 දෘෂ්‍ය වංචනික ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රත්නපුර අධ්‍යාපන කලාපයේ මහා විද්‍යාලයක බුදු මැදුරක් ඉදිකිරීමේ කටයුතු 2009 වර්ෂයේ දී ආරම්භ කර තිබුණ ද, විගණිත දිනය වූ 2011 ඔක්තෝබර් 20 දින වන විටත් නිමවා නොතිබුණු මෙම කර්මාන්තයේ අයවැය පිළිබඳ විමසීමේ දී විදුහල්පතිවරයා විසින් දෙමාපිය කමිටුවක් මගින් අවශ්‍ය මුදල් හා ද්‍රව්‍ය භාර ගත් බව ප්‍රකාශ කළ ද, සියළු මුදල් හා ද්‍රව්‍ය විදුහල්පතිවරයා විසින් ලබාගෙන වියදම් කළ බව ස්වකැමැත්තෙන් විගණනයට සාක්ෂි ලබා දුන් ගුරුවරුන් සහ පවුල් ඒකක 16 ක් නියෝජනය කළ දෙමාපියන්ගෙන් පමණක් රු.47,000 ක මුදලක් ලදු පත් නිකුත් නොකොට විදුහල්පතිවරයා විසින් ලබාගෙන තිබීමෙන් අනාවරණය වූයෙන් ද, සාධාරණ වශයෙන් එකතු විය යුතු වටිනාකමට සමාන වැඩ වටිනාකමක් ඉටුකර නොමැති බැවින් ද , මෙම මුදල් විදුහල්පති විසින් පෞද්ගලික පරිහරණයට යොදා නොගත්තේ යැයි විගණනයට සෑහීමකට පත්විය නොහැක.

(ආ) රත්නපුර අධ්‍යාපන කලාපයේ මහා විද්‍යාලයක විදුහල්පති විසින් එකතුව රු.306,988 ක් වූ ව්‍යාජ බිලපත් සහ මිල කියුම් භාවිතා කරමින් ද, රජයේ සම්මත ප්‍රසම්පාදන ක්‍රම වේදයන් අනුගමනය කළ බව දැක්වෙන ව්‍යාජ තහවරු ලේඛන ගොනු කරමින් ද එකතුව රු.259,002 ක මිල දී ගැනීම් සිදුකළ බවට දක්වමින් පාසල් සංවර්ධන සමිති ගිණුමෙන් ගෙවීම් කර තිබුණු අතර, තහවුරු සාක්ෂි අනුව මෙම ව්‍යාජ මිල කියුම්වල දැක්වෙන ආයතන සත්‍ය වශයෙන් නොපවතින බවද රු.100,213 ක් වූ ගෙවීමක් සඳහා ඉදිරිපත් කර තිබූ බිල්පතෙහි සඳහන් ආයතනය විසින් එවැනි බිල්පතක් නිකුත් නොකළ බවද, එම වැඩ කොටස් ඉටු නොකළ බවද, එකී වටිනාකමට අදාල චෙක්පත් හෝ මුදල් භාර නොගත් බවට ද විගණනයේ දී තහවුරු විය. අදාල විදුහල්පතිවරයාට විරුද්ධ විනය පියවර ගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

2.11 ප්‍රමාණවත් ලෙස ඉටු නොවූ අරමුණු

බිම්මල් වගාව සඳහා 50% සහනාධාර මත බලංගොඩ දහමාන කෘෂි උපදේශක කාර්යාලය වෙත ලබා දී තිබූ කෘමි ප්‍රතිරෝධක දැල් වර්ග මීටර් 314 ක් තුලින් වර්ගමීටර් 260 ක් එනම් 83% ක් ගොවීන් වෙත බෙදා දී තිබූ අතර ඉතිරි වර්ග මීටර් 54 ක් එනම් 17% ක් ගොවීන් වෙත ලබා නොදී කාර්යාලයේ රඳවා ගෙන තිබුණි. තවද බෙදා දී තිබූ දැල් අතරින් වර්ග මීටර් 172.5 ක් එනම් 66% ක් භෞතිකව නියැදි පරීක්ෂාවට ලක් කල අතර එයින් 88% ක් එනම් වර්ග මීටර් 152.5 ක් භාවිතා කිරීමෙන් තොරව ගොවීන් ලඟ තිබූ අතර 12% ක් වූ වර්ග මීටර් 20 ක් පමණක් අදාල කාර්යයන් සඳහා භාවිතා කර තිබුණි. ඉහත පරිදි කෘෂි උපකරණ බෙදා හැරීමෙන් පසුව කරනු ලබන පසු විපරම් කටයුතු ප්‍රමාණවත් නොවන බැවින් ඉහත පරිදි ව්‍යාපෘතීන් අසාර්ථක වන බැව් විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.

2.12 අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සම්පත් දායකයින් 25 දෙනෙකු අදාල ලේඛනයේ පැමිණීම පිටවීම තහවුරු නොකර පැය 171 ක් සඳහා රු.61,750 ක් ද, පාඨමාලාව සඳහා කිසිදු ශිෂ්‍යයෙකු සහභාගි නොවී සම්පත් දායකයින් 10 දෙනෙකු පැය 86 ක් සඳහා රු.26,900 ක් ද, දිනකට දේශන පැවැත්විය හැකි උපරිම කාලය වූ පැය 07 ක කාලය ඉක්මවමින් සම්පත්දායකයින් 16 දෙනෙකු සඳහා පැය 240 කට රු.96,500 ක් ද, වශයෙන් නිසි අධීක්ෂණයකින් තොරව වැඩිපුර ගෙවා තිබූ බව පනාවල නැටුම් පුහුණු මධ්‍යස්ථානය පරීක්ෂාවේ දි විගණනයට අනාවරණය විය.

(ආ) මහවිල වරකාගොඩ ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා 2010 දෙසැම්බර් 17 වන දින රු.765,687 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර 2011 දෙසැම්බර් 06 වන දින විගණනය විසින් එකී කර්මාන්තය භෞතිකව පරීක්ෂා කිරීමේ දී රු.154,692 ක් ගෙවා තිබූ අයිතම් අංක 06 යටතේ සිදු කළ යුතු වැඩකොටස් නිසි ප්‍රමිතයට සිදු කර නොතිබුණු බවත් ඉදිකරන ලද ගේට්ටුවේ තීන්ත ආලේප නොකිරීමෙන් එය මළ බැඳීමේ අවදානමකට ලක්ව තිබූ බවත් කර්මාන්තය නිමකර වසරක් ඉක්ම ගොස් තිබුණ ද එහි භූමිය නිසි පරිදි සකසා නොතිබීම හේතුවෙන් වල් බිහි වී ප්‍රයෝජනයක් ගත නොහැකි තත්ත්වයට පත්වී ඇති බවත් නිරීක්ෂණය විය. එසේ වුව ද කාර්මික නිලධාරිගේ ව්‍යාජ වාර්තා මත 2011 මැයි 04 වන දින රු.86,032 ක් වූ රුඳවුම් මුදලද නිදහස් කර තිබුණි. තවද මෙම කර්මාන්තයට අදාලව සකසා තිබූ ඇස්තමේන්තුවේ ක්‍රීඩාපිටිය වටා යෙදිය යුතු දැල් ආවරණය අන්තර්ගත වී නොතිබුණි.

(ඇ) කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාල පරිශ්‍රයේ පිහිටි ආපනශාලාව ටෙන්ඩර් ක්‍රියා පටිපාටියෙන් බැහැරව ද , කුලී කරු සමඟ ගිවිසුම් ගත වීමකින් තොරව ද වර්ෂ ගණනාවක සිට පවත්වාගෙන ගොස් තිබූ අතර කුලී මුදල් තීරණය කිරීම ද විනිවිද භාවයකින් තොරව සිදුකර තිබුණි. තවද, ආපන ශාලා කුලී ලෙස 2004 වර්ෂයේ සිට 2010 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 30 කදී ලැබී තිබුණු රු.90,600 ක මුදල රජයේ ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු වවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඈ) කෑගල්ල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ආපන ශාලාව ටෙන්ඩර් කිරීමකින් තොරව ලබා දී තිබූ අතර, 1994 වර්ෂයේ සිට 2012 දක්වා කාල සීමාව තුළ දී බදු කුලී ලෙස ලැබී තිබුණු රු.64,350 ක මුදල රජයේ ආදායමට බැර කළ යුතු වුවත්, එය සේවක සුභ සාධක නමින් ගිණුමට බැර කර ඇති බැව් අනාවරණය විය.

(ඉ) මාවනැල්ල මූලික රෝහලේ කිලිටි රෙදි සේදීම සඳහා 2011 වර්ෂය සඳහා ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීමෙන් තොරව 2010 ටෙන්ඩර් ඇප තැන්පත්කරුවන් අතරින් ටෙන්ඩර්කරු තෝරා ගෙන තිබුණි. එම වර්ෂයේ ඇප තැන්පත්කරුවන් තෝරා ගැනමේදී පිරිවිතර නිසිලෙස හඳුන්වා නොදීම හේතුවෙන් වැඩි මිල ගණන් යටතේ ටෙන්ඩර්කරුවන් තෝරා ගෙන තිබූ බැවින් 2011 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා රෝහල් වාට්ටු සඳහා රු. 34,922 ක් සහ ශල්‍යාගාර සඳහා රු. 249,192 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(ඊ) 1992 වර්ෂයේ දි ආරම්භකර 2010 ඔක්තෝබර් 05 දින දක්වාම නිල නොවන සංවිධානයක් ලෙස ඇඹිලිපිටිය මූලික රෝහලේ පවත්වාගෙන යනු ලබන සුභසාධක සමිති අරමුදලේ 2010 වර්ෂය තුළ දෛනික ලැබීම්, ගෙවීම් හා අවසාන අත ඉතිරි මුදල් හා බැංකු ශේෂය ගැලපුම් කරමින් පිළියෙල කළ දෛනික ලැබීම් හා ගෙවීම් අනුව රු.224,777 ක මුදල් ඌනතාවයක් නිරීක්ෂණය විය.

2.13 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ රු.100,000 ක ප්‍රතිපාදන සහ පාසැල් සංවර්ධන සමිති අරමුදල භාවිතයෙන් කහවත්ත දෙමළ මහා විද්‍යාලයේ කියවීම් කාමරය සඳහා රු.101,877 ක උපකරණ මිල දී ගෙන 2011 ජුනි 03 දින තොග ලේඛන ගත කර තිබුණ ද , විගණිත දිනය වූ 2011 නොවැම්බර් 15 දින වන විටත් විද්‍යාලයේ පන්ති කාමර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කියවීම් කාමරය සඳහා නිශ්චිත ස්ථානයක් වෙන්කර නොතිබූ අතර, අදාල උපකරණ විද්‍යාලයේ පන්ති කාමර කිහිපයක් තුළ තැන්පත් කර නිශ්කාර්යව පැවතුණි.

(ආ) බලංගොඩ විධායක ඉංජිනේරු කාර්යාලය විසින් 2011 අගෝස්තු 11 දින වන විට තාර තොග පොත තුලනය කර නොතිබුණු අතර, අවසන් වරට තුලනය කර තිබූ 2011 ජූලි 12 දිනට ශේෂය ලීටර 180 තාර බැරල් 48 ක් විය. එම දිනට පසුව අවස්ථා තුනක දී තාර බැරල් 15 ක් නිකුත් කර තිබුණු අතර, ඒ අනුව පොතේ ශේෂය බැරල් 33 ක් විය යුතු වුවද, ඉහත දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී ලීටර් 180 තාර බැරල් 51 ක් විගණනයට ඉදිරිපත් විය. ඒ අනුව ලේඛනයට ඇතුලත් නොකළ තාර බැරල් 18 ක අතිරික්තයක් නිරීක්ෂණය වූ අතර, භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් වූ තාර බැරල් 51 අතරින් 10 ක් කාර්මික නිලධාරිවරයකු වාසය කරන නිල නිවාසයක් තුල සහ 03 ක් ඉඩි යතුරුලා වසා තිබූ කාමරයක් තුල දමා තිබීම හේතුවෙන් තාර භාවිතා කිරීම පිළිබඳව නිසි සුපරීක්ෂණයක් හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ආයතනය තුල ස්ථාපිත කර නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) රත්නපුර අධ්‍යාපන කලාපයේ මධ්‍ය මහා විද්‍යාලයක් විසින් 2011 ජනවාරි සිට පාසල පැවැත්වෙන දිනකට රු.1,300 බැගින් වූ බදු මුදලකට වසර දෙකක් සඳහා විද්‍යාලයේ ආපන ශාලාව බදු දී ඇතත්, 2011 නොවැම්බර් 23 (විගණිත දිනය) වන විටත් අදාල කුලී ආදායම ලෙස ලැබිය යුතු එකතුව රු.173,620 ක් වූ මුදල් අයකර ගෙන නොතිබුණි.

(ඈ) මාවනැල්ල අධ්‍යාපන කලාපයේ විද්‍යාලකට ගුණාත්මක යෙදවුම් වෙනුවෙන් 2008,2009 සහ 2010 වර්ෂ සඳහා ලබාදුන් ප්‍රතිපාදන වලින් රු.240,991 ක මුදලක් 2011 දෙසැම්බර් මාසය වන විටත් වියදම් නොකර ඉතිරි වී තිබුණි.

(ඉ) 2012 ජනවාරි වන විට කෑගල්ල අධ්‍යාපන කලාපයට අයත් වසා දැමූ පාසැල් 31 ක් අතුරින් පාසැල් 06 ක් වසා දමා වසර 10 ක කාලයක් ඉක්මවා තිබුණද අදාල දේපළ ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දීමට පියවර ගෙන නොතිබුණු අතර, 1999 වර්ෂයේ දී වසා දමා තිබුණු කෑ/දියගම කණිෂ්ඨ විද්‍යාලයේ ගොඩනැගිලි හා ඉඩම නිරවුල් කර ගැනීමට 2012 වර්ෂය වන විටත් පියවර ගෙන නොතිබුණි. තවද, කෑගල්ල නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පවතින ග්‍රාමීය රෝහල් සහ මධ්‍යම බෙහෙත් ශාලා 06 කට අදාල ගොඩනැගිලි හා ඉඩම් හඳුනාගෙන අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv වැනි පරිච්ඡේදයේ 12 වන උප වගන්තිය ප්‍රකාරව සාමාන්‍ය රාජකාරි ඉටු කිරීමේ දී වැඩිපුර ගමන් බිමන් යාමට සිදුවන නිලධාරියෙකු අදාල රාජකාරි සම්බන්ධයෙන් ප්‍රමාණවත් වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ සම්බන්ධව නිශ්චිත දීමනාවක් ගෙවීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හැකියාව ඇති නමුත්, 2011 වර්ෂය සඳහා ප්‍රජා සංවර්ධන නිලධාරීන්ට යථෝක්ත පරිවර්තිත දීමනා ලෙස රු.175,093 ක් ගෙවා තිබුණ ද, එකී

නිලධාරීන්ට පවරා ඇති රාජකාරි මගින් ආවරණය වන විවිධ විෂයය ක්ෂේත්‍රයන්ට අදාලව පරීක්ෂාවට ලක් වූ සියළු මාස සඳහා අඛණ්ඩව අධීක්ෂණ වාර්තා පිළියෙල කර නොතිබූ අතර, වාර්තා කිහිපයක් පමණක් ඉදිරිපත් කර තිබූ බව නිරීක්ෂණය විය.

(උ) සබරගමු පළාත් පුස්තකාල සේවාව විධිමත්ව පවත්වා ගෙන යාම, පාඨක අවශ්‍යතා සපුරාලීම සහ තවත් විශේෂිත වූ අරමුණු කිහිපයක් පෙරදැරි කර ගනිමින් පුස්තකාල සේවා මණ්ඩලයක් පිහිටුවීම සඳහා සබරගමුව පළාත තුළ පළාත් පාලන ආයතන 24 ක් මගින්, රු.50,000 බැගින් එකතුව රු.1,200,000 ක් 2010 වර්ෂය තුළ දී ලබා ගෙන තිබූ අතර, වර්ෂ 02 කට ආසන්න කාලයක් ගත වී තිබූ නමුත්, මෙම පුස්තකාල සේවා මණ්ඩලය පිහිටු වීමට කටයුතු කර නොතිබූ බැවින්, මෙකී තැන්පතු නිෂ්කාර්යව පැවැතුණි.

(ඌ) 2008 මැයි 14 දින සිට 2010 මාර්තු දින දක්වා වූ කාලය තුළ ලියාපදිංචි කර ඇති ඉඩම් ඔප්පු 24 ක් අදාල බලපත්‍රලාභීන් වෙත බෙදා නොදී ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ රඳවාගෙන තිබුණු අතර, ඉඩම් රන්බිම ඔප්පු 23 ක් අදාල බලපත්‍රලාභීන් වෙත බෙදා දීමකින් තොරව වර්ෂ 02 කට ආසන්න කාලයක් තිස්සේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ රඳවා තිබුණි.

(එ) 2003 වර්ෂයේ සිට 2011 වර්ෂයේ අප්‍රේල් මාසය දක්වා අවස්ථා 38 ක දී ඖෂධ ඒකක 391,924 ක් තත්ත්වයෙන් අසමත් බව හඳුනා ගැනීමෙන් අනතුරුව පාවිච්චියෙන් ඉවත් කර තිබූ අතර ඒ සඳහා නැවත බෙහෙත් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණු අතර, 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය අවසාන වන විට භාණ්ඩ හා ඖෂධ වර්ග 11 කට අදාල ඒකක 60,804 ක් කල් ඉකුත් වීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර තිබ අතර කල් ඉකුත් වීමට පෙර සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඒ) රක්වාන ඩිප්ඩීන් වත්තේ සනීපාරක්ෂක වැසිකිළි ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ අදියර තුනකින් ලබාදුන් රු.750,000 ක මුදල අදාල ප්‍රතිලාභීන් වෙත බෙදා හැරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල නිසි පරිදි අනගමනය නොකිරීමෙන් හා ප්‍රතිලාභීන්ගේ අත්සන් වල පරස්පරතා තිබීමෙන් ආධාර මුදල් බෙදා හැරීම පිළිබඳව විගණනයට සෑහීමට පත්විය නොහැක.

(ඔ) 2011 වර්ෂයේ දී කෑගල්ල නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ක්ෂය රෝග නිවාරණ වැඩසටහන සහ ඩෙංගු නිවාරණ වැඩසටහන සඳහා රු.690,500 ක් ලැබී තිබුණු අතර, එම වැඩසටහන් සම්පූර්ණයෙන් ඉටු කිරීමෙන් තොරව රු.313,473 ක් ආපසු යවා තිබුණි.

(ඕ) සබරගමුව පළාත් සභාව වෙනුවෙන් 2007 වසරේ සිට 2012 වසර දක්වා උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහා 2011 දෙසැම්බර් මස දක්වා ප්‍රධාන ලේකම් කාර්යාලය සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් අංශය විසින් රු.2,274,237 ක මුදලක් වැයකර තිබුණු අතර, කෙටුම්පත් උපාය මාර්ග සැලැස්ම 2011 ඔක්තෝබර් 18 වන දින පළාත් සභාවට ඉදිරිපත් කර තිබුණ ද 2012 අගෝස්තු 07 දින දක්වා එය අනුමත කර එහි ප්‍රතිලාභ පළාත් සභාව වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

2.14 කාර්ය සාධනය

2.14.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ප්‍රභවය | ප්‍රතිපාදනය | වියදම | ඌන උපයෝජනය/ (අධි උපයෝජනය) |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| i. | උපමාන පාදක ප්‍රදාන | 284,580,000 | 321,413,062 | (36,833,062) |
| ii. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,075,250,000 | 1,087,048,864 | (11,798,864) |
| iii. | විශේෂ ව්‍යාපෘති | 350,198,376 | 193,870,823 | 156,327,553 |
| iv. | ලෝක බැංකු | 51,705,401 | 110,225,343 | (58,519,942) |

2.14.2 පළාත් සංවර්ධන සැලැස්ම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අඛණ්ඩ වැඩ යටතේ එකතුව රු.2,050,659,995 ක වූ වැඩ යෝජනා 4688 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනා වල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | | නව වැඩ | අඛණ්ඩ වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|---|
| (අ) | සම්පූර්ණයෙන් නිමකළ | 2253 | 1132 | 3385 |
| (ආ) | 50% කට වඩා අඩුවෙන් නිමකළ | 348 | 13 | 361 |
| (ඇ) | 50% කට වඩා වැඩියෙන් නිමකළ | 793 | 116 | 909 |
| (ඈ) | ආරම්භ කර නොතිබූ | 27 | 6 | 33 |
| (ඉ) | මතභේදයට/ ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | - | - | - |
| | එකතුව | 3421 | 1267 | 4688 |

2.15 කොන්ත්‍රාත් පරිපාලනය

2.15.1 ව්‍යාපෘති/ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද

පහත දැක්වෙන ව්‍යාපෘති /යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයක් දක්නට තිබුණි.

| | ව්‍යාපෘතිය / යෝජනා ක්‍රමය | ඇස්තමේන්තු ගත පිරිවැය රු. | ආරම්භ කළ දිනය | නිම කිරීමට ඉලක්ක කළ දිනය | 2011 දෙසැම්බර් 31 දින දක්වා දරන ලද වියදම රු. | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|
| (අ) | ර/ඇඹි / මාදම්පේ අංක 01 දෙමළ විද්‍යාලය - වැසිකිළි ව්‍යාපෘතිය | 118,388 | 2011.09.29 | 2012.01.27 | -- | පාසල් සංවර්ධන සමිතියේ ප්‍රමාද |
| (ආ) | ර/ඇඹි / රත්නාලෝක මහ විද්‍යාලය - වහල අලුත්වැඩියාව | 725,238 | 2011.10.20 | 2012.01.20 | -- | ඇස්තමේන්තුවේ දෝෂයක් හේතුවෙන් වැඩ නතර කිරීමට උපදෙස් දී ඇත. |
| (ඇ) | ර/ඇඹි / පදලංගල විද්‍යාලය - කාණු පද්ධතිය අලුත්වැඩියාව | 1,049,896 | 2011.11.09 | 2012.02.09 | -- | සහකාර ලේකම් (සංවර්ධන) වාචිකව දෙන ලද උපදෙස් මත |
| (ඈ) | බටතොට පාලම ඉදිකිරීම | 13,025,000 | 2010.01.15 | 2011.12.31 | 7,299,923 | සැලැස්මේ දෝෂයක් හේතුවෙන් |
| (ඉ) | දෙල්ගොඩ එළවැල්ල පාලම ඉදිකිරීම | 14,000,000 | 2009.12.18 | - | 12,154,741 | අධික වර්ෂාව |

- පළාත් උපමාන පාදක සංවර්ධන සැලැස්ම යටතේ 2010 වර්ෂයේ ප්‍රතිපාදිත රු.706,000 කින් වර්ෂය අවසානයට වැඩ අවසන් කළ කර්මාන්ත 08 කට අදාල එකතුව රු.608,066 ක වැඩ අග්‍රිමය නොලැබීම නිසා අවිච්ඡේද කර තිබුණි.

2.15.2 සම්පූර්ණයෙන් අත්හැර දමා ඇති ව්‍යාපෘති/ යෝජනා ක්‍රම

පහත සඳහන් ව්‍යාපෘති / යෝජනා ක්‍රම ආරම්භ කිරීමකින් තොරව සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි.

| | ව්‍යාපෘතිය / යෝජනා ක්‍රමය | ඇස්තමේන්තුගත පිරිවැය (රු.) |
|---|---|---|
| (අ) | ර/පාතකඩ දෙමළ විද්‍යාලයේ වැසිකිලි 03 ක් සහ කැසිකිලි 02 ක් ඉදිකිරීම | 865,000 |
| (ආ) | ර/බල/වලේබොඩ දෙමළ විද්‍යාලය- වැසිකිලි 02 ක් හා කැසිකිලියක් ඉදිකිරීම | 237,498 |
| (ඇ) | ර/නිවි/ගෙඩගල විද්‍යාලය -60`x20` වහළ අලුත්වැඩියාව | 805,841 |
| (ඈ) | කෑ/දෙහි/මියනවිට දෙමළ විද්‍යාලය පාසල් ගොඩනැගිලි අලුත්වැඩියාව | 1,470,000 |
| (ඉ) | ර/බල/මහවලතැන්න විද්‍යාලය ජල ටැංකිය ඉදිකිරීම | 203,412 |
| (ඊ) | ර/බල/මහවලතැන්න විද්‍යාලය මායිම් කම්බි ඇල හා පිවිසුම් දොරටුව ඉදිකිරීම | 738,214 |
| (උ) | ර/බල/මහවලතැන්න විද්‍යාලය ආරක්ෂක තාප්පය ඉදිකිරීම | 933,393 |

2.15.3 ඉදිකිරීම්

ඉදිකිරීම් කටයුතු පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණවලදී දක්නා ලද අඩුපාඩු පහත දැක්වේ.

(අ) මොරහැල අමු පිටිය මාර්ගය කි.මී. 2.00-5.26 දක්වා වැඩි දියුණු කිරීමේ කර්මාන්තය සඳහා 2009 වර්ෂයේ දී රු.7,265,000 ක වටිනාකමකින් යුත් වියදම් ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කර තිබුණු අතර, ටෙන්ඩර් කැඳවීමෙන් පසු ඉදිකිරීම් කටයුතු පැවරූ සමාගමේ ඉදිකිරීම් ප්‍රගතිය දුර්වල බැවින් 2010 දෙසැම්බර් 17 දින ගිවිසුම අවලංගු කර සෘජු ශ්‍රම පදනම මත ඉදිකිරීම් සිදු කිරීම පළාත් මාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර තිබුණි. සෘජු ශ්‍රම පදනම මත ඉටු කරන කර්මාන්ත වල ඉදිකිරීම් 2010 දෙසැම්බර් 31 දිනට අවසන් කරන ලෙස අධ්‍යක්ෂ (මාර්ග) විසින් දන්වා තිබුණු අතර, 2010 දෙසැම්බර් 31 දින වන විට මෙම කර්මාන්තය සඳහා මිල දී ගත් ඉදිකිරීම් ද්‍රව්‍ය වලින් 2011 අගෝස්තු 10 දින වන විට රු.81,768 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ආ) ගවරන්හේන සෞඛ්‍ය මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා මාස 2 1/2 ක කාලයක් සඳහා 2009 ඔක්තෝබර් 20 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර, ගිවිසුම් ගත වටිනාකම රු.552,310 කි. 2010 මාර්තු 26 දින වන විට මේ සඳහා රු.475,573 ක් ගෙවා තිබුණි. මෙම ගොඩනැගිල්ල සඳහා ජලය සැපයීම සම්බන්ධ නිසි සැලැසුම් සකස් නොකිරීම සහ කොන්ත්‍රාත්කරු ඉදිකිරීම අතර මග නවතා දැමීම හේතුවෙන් රු.282,000 ක අතිරේක ඇස්තමේන්තුවක් සකස් කර වැඩ නිම කර තිබුණු අතර, එහි දී රු.235,693 ක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව රු.552,310 කින් නිම කිරීමට තිබු කර්මාන්තය සඳහා අමතරව රු.158,956 ක් ගෙවීමට සිදු වී තිබුණි. එහෙත් පෙර කොන්ත්‍රාත්කරුගේ කාර්ය සංසිද්ධි ඇපකරයේ කාලය දීර්ඝ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ගිවිසුම කඩ කිරීම නිසා රජයට වූ අලාභය අය කර ගැනීමට 2012 මැයි 23 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) කුරුවිට කුරු ගඟ හරහා බටතොට පාලම ඉදිකිරීමේ කර්මාන්තය සඳහා 2011 පෙබරවාරි 10 වන දින කොන්ත්‍රාත්කරුවෙකු සමග රු.9,139,119 ක් වටිනාකමැති ගිවිසුමකට එළඹ තිබුණද, කර්මාන්තය සම්බන්ධයෙන් සියළු අවදානම් ආවරණය සඳහා රක්ෂණ සහතිකයක් ලබාගෙන නොමැති අතර කර්මාන්තයේ කාලසීමාව ආවරණය වන පරිදි කාර්ය සාධන ඇපකරයක් ලබාගැනීමටද කටයුතු කර නොතිබුණි. 2010 සැප්තැම්බර් 15 දින වැඩ නිම කිරීමට සැලසුම් කර තිබූ මෙම කර්මාන්තය විගණිත දිනය වූ 2011 නොවැම්බර් 24 දින වන විට වැඩ ආරම්භ කර වසර දෙකක් ගතවී ඇතත්, ප්‍රගතිය 55% ක් පමණක් වූ අතර ඒ වෙනුවෙන් 2010 දෙසැම්බර් 06 දින වන විට රු.5,507,729 ක් ගෙවා තිබුණද, දකුණු පස සහ වම් පස රුඳවුම් බැම් පාරු ගලට සම්බන්ධ කිරීමට "ඩවල්ස්" නොගැසීම, ප්‍රධාන කුළුණුවල පාදම් කොන්ක්‍රීට් කිරීමේදී කොන්ක්‍රීට් මිශ්‍රණය අතරට 6" x 9 " සක්ක ගල් භාවිතා කර තිබීම යන කරුණු අනාවරණය වූ අතර නියමිත ආකාරයට සැටලීම නොගැසීම නිසා තෙවන කුළුණේ පිටත නිමාව සතුටුදායක මට්ටමක නොතිබුණු අතර එය මඳක් ඇලවී සෘජු නොවන ස්වභාවයක් ගෙන ඇති බැව් නිරීක්ෂණය විය.

(ඈ) මාපලාන කවුඩාව මාර්ගයේ ඇල්ල ඔය පාලම, දිග මීටර් 14 ක් සහ පළල මීටර් 4.8 ක් ඉදිකිරීමේ කර්මාන්තයෙහි අතිරේක වැඩ නිම කිරීම සඳහා 2010 දෙසැම්බර් 24 වන දින කොන්ත්‍රාත්කරුවෙකු සමග රු.4,610,040 ක් වටිනාකමැති ගිවිසුමකට එළඹ තිබුණද, විගණිත දින වන විටත් සියළු අවදානම් ආවරණය සඳහා රක්ෂණ සහතිකයක් ලබාගෙන නොතිබුණු අතර, කර්මාන්තයේ වැඩ වසරකින් පමණ ප්‍රමාද වී තිබුණි. තවද, පියාපත් බැම් ඉදිකිරීමේදී යොදා තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණයේ කඩතොළු සහ කුඩා කුහර නිරීක්ෂණය වූ අතර පාලමේ "කෙලවර ගල්" සහ පැති ලෑලි අතර යොදා තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණයේ නිමාව ඉතා අසතුටුදායක මට්ටමක පවතින බව 2011 දෙසැම්බර් 02 වන දින විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේ දී අනාවරණය විය.

(ඉ) බලවින්න පින්නකන්ද මාර්ගය නඩත්තු කිරීමේ කර්මාන්තය 2011 නොවැම්බර් 03 දින විගණනය විසින් භෞතිකව පරීක්ෂා කිරීමේ දී මාර්ගය අළුත්වැඩියා කර මාස හතරක් ගතවීමටත් පෙර මාර්ගය පුරාම කඩතොළු සෑදී තිබුණු අතර දෙපස කාණු නියමිත ගැඹුරින් සකසා නොතිබීම නිසා පස් පිරී වතුර බැස යාම අවහිර වී තිබුණි. තවද දෙපස උස් ස්ථාන කපා ඉවත් කර නොතිබුණි. නඩත්තු කටයුතු සිදු කිරීමේ දී අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතු කාර්යයන් හඳුනාගෙන කටයුතු නොකිරීම නිසා රු.1,483,180 ක් වැය කර නඩත්තු කර තිබූ මෙම කර්මාන්තයේ ඵලදායිතාවය හීන වී ඇති බැව් විගණනයේ දී නිරීක්ෂණය කෙරේ.

(ඊ) රත්නපුර දිස්ත්‍රික්කය තුළ ඇස්තමේන්තුගත අගයේ එකතුව රු.17,227,497 ක් වූ මාර්ග ඉදිකිරීම් හා වැඩි දියුණු කිරීමේ කර්මාන්ත 10 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකතුව රු.12,976,400 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණ ද එම කර්මාන්ත භෞතික පරීක්ෂාවන්හි දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය වූ හෙයින් මෙම මාර්ගයන්හි කල් පැවැත්ම පිළබඳව විගණනයේ දී සෑහීමකට පත් විය නොහැක අතර, කර්මාන්ත 06 කට අදාලව කොන්ත්‍රාත් පැවරීමේ ලිපියෙහි සඳහන් පරිදි කොන්ත්‍රාත්කරු විසින් ලබා ගත යුතු වන රක්ෂණ සහතිකය ද ලබාගෙන නොතිබුණි.

i. නියමිත ප්‍රමිතියට ගල්, වැලි , සිමෙන්ති යොදවා නොතිබීම.

ii. 3/4" ගල් වෙනුවට 1/2" ගල් භාවිතා කිරීම.

iii. මාර්ග තලය මතුපිට පෘෂ්ඨය තලා සම මට්ටමට නොගැනීම.

iv. නියමිත ප්‍රමාණයට තාර ආලේප නොකිරීම.

v. ඉහත හේතු නිසා ඉතා කෙටි කාලයක දී මාර්ගයේ බොහෝ තැන්වල කඩතොළු හා වලවල් පැවතීම.

3.16 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් පළාත් සභාවේ මුළු වැය ශීර්ෂ ගණනින් 41% ක් සමාලෝචිත වර්ෂය තුළ දී විගණනයට භාජනය කර නොතිබුණු අතර, වාර්ෂික විගණන සැලසුමෙහි ඇතුළත් ආයතන 60 ක් සම්බන්ධයෙන් වර්ෂය තුළ දී කිසිදු විගණනයක් සිදුකර නොතිබීමෙන් සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක වී නොමැති බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර සබරගමුව පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය හා මූල්‍ය පාලනය.

(ආ) වත්කම් හා මානව සම්පත්.

(ඇ) ගබඩා පාලනය.

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය.

(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(ඊ) තොරතුරු කළමනාකරණය.

(උ) පාසල් කළමනාකරණය.